(නවවැනි පාර්ලිමේන්තුව - පස්වැනි සභාවාරය)

අංක **13**. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2024 මාර්තු 22 සිකුරාදා පූ.භා. 9.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **අජිත් රාජපක්ෂ මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද අමරවීර මහතා,** කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය සහ වාරිමාර්ග අමාත්‍යතුමිය

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා,** අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජගත් පුෂ්පකුමාර මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශාන්ත බණ්ඩාර මහතා,** ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** පළාත් සභා, පළාත් පාලන සහ පරිසර රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තේනුක විදානගමගේ මහතා,** නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** මුදල් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** විදුලිබල හා බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා**

ගරු  කපිල අතුකෝරල මහතා

ගරු  තිස්ස අත්තනායක මහතා

ගරු  හෙක්ටර් අප්පුහාමි මහතා

ගරු  වජිර අබේවර්ධන මහතා

ගරු  (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය

ගරු  තුෂාර ඉඳුනිල් අමරසේන මහතා

ගරු  මායාදුන්න චින්තක අමල් මහතා

ගරු  තවරාජා කලෙයි අරසන් මහතා

ගරු  ජේ. සී. අලවතුවල මහතා

ගරු  මහින්දානන්ද අලුත්ගමගේ මහතා

ගරු  සංජීව එදිරිමාන්න මහතා

ගරු  ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු  ගයන්ත කරුණාතිලක මහතා

ගරු  නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු  ජයන්ත කැටගොඩ මහතා

ගරු  නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු  ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු  මනෝ ගනේෂන් මහතා

ගරු  උදය ගම්මන්පිල මහතා

ගරු  (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු  උදයකාන්ත ගුණතිලක මහතා

ගරු  මිලාන් ජයතිලක මහතා

ගරු  නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු  පියංකර ජයරත්න මහතා

ගරු  (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු  දයාසිරි ජයසේකර මහතා

ගරු  එම්. එස්. තවුෆික් මහතා

ගරු  (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු  එස්. බී. දිසානායක මහතා

ගරු  මයන්ත දිසානායක මහතා

ගරු  සාරතී දූෂ්මන්ත මහතා

ගරු  (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු  ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු  නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු (මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය

ගරු ජගත් ප්‍රියංකර මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු පාඨලී චම්පික රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු සී. වී. විග්නේෂ්වරන් මහතා

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**

**ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**

**ගරු නීතිඥ මධුර විතානගේ මහතා**

**ගරු හේෂා විතානගේ මහතා**

**ගරු විමල් වීරවංශ මහතා**

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**

**ගරු ඩී. වීරසිංහ මහතා**

**ගරු වීරසුමන වීරසිංහ මහතා**

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**

**ගරු ජගත් සමරවික්‍රම මහතා**

**ගරු ජයන්ත සමරවීර මහතා**

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**

**ගරු වඩිවේල් සුරේෂ් මහතා**

**ගරු නීතිඥ ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න මහතා**

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා**

**ගරු විජිත හේරත් මහතා**

**ගරු ජයරත්න හේරත් මහතා**

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**

**ගරු මර්ජාන් ෆලීල් මහතා**

**ගරු ඒ. එච්. එම්. ෆවුසි මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන:** නියෝජ්‍ය කථානායකවරයා විසින් මතු පළවන නිවේදන කරන ලදී:—

I

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 143 ප්‍රකාරව නවවැනි පාර්ලිමේන්තුවේ පස්වැනි සභාවාරය තුළ සේවය කිරීම පිණිස සභාපති නාමාවලියට දැනට නම් කරනු ලැබ තිබෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කිංස් නෙල්සන් මහතා ද ගරු කථානායකතුමා විසින් නම් කරනු ලබන බව පාර්ලිමේන්තුවට දන්වනු කැමැත්තෙමි."

II

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා

ගරු ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි මහතා

ගරු නීතිඥ මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා

ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා"

III

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 116හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා

ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු එස්. බී. දිසානායක මහතා

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා

ගරු යදාමිණී ගුණවර්ධන මහතා"

IV

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 117හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ගෘහාශ්‍රිත කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු තේනුක විදානගමගේ මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා

ගරු ඒ. එල්. එම්. අතාඋල්ලා මහතා

ගරු නිමල් ලාන්සා මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය"

V

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 121හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා"

VI

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 122හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු චමල් රාජපක්ෂ මහතා

ගරු නීතිඥ අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු ගාමිණී ලොකුගේ මහතා

ගරු සම්පත් අතුකෝරල මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා"

VII

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 123හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු ශෙහාන් සේමසිංහ මහතා

ගරු කනක හේරත් මහතා

ගරු තාරක බාලසූරිය මහතා

ගරු සී. බී. රත්නායක මහතා

ගරු එස්. එම්. චන්ද්‍රසේන මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු ධම්මික පෙරේරා මහතා

ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා"

VIII

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 129හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි :—

ගරු කපිල අතුකෝරල මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය''

IX

''පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා

ගරු වජිර අබේවර්ධන මහතා

ගරු සුදත් මංජුල මහතා''

X

''පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද 2024 පෙබරවාරි 09 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, මහජන ආරක්ෂක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරයන් ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:—

ගරු සී. බී. රත්නායක මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු නීතිඥ මධුර විතානගේ මහතා''

**2. ලිපිලේඛනාදිය පිළිගැන්වීම**: (1) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(2) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 117(2)(ඝ) වගන්තිය යටතේ කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය හරහා පියාසර කරන ගුවන්යානා වෙත ශ්‍රී ලංකාව විසින් සපයනු ලබන ගගන නාවික පහසුකම් සහ සේවාවන් භාවිත කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු සම්බන්ධයෙන් වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 දෙසැම්බර් 12 දිනැති අංක 2362/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි ඉදිරිපත් කර, එම රෙගුලාසි වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින්—

(i) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදලේ වාර්ෂික වාර්තාව

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2022 වර්ෂය සඳහා ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් 2021 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**3. පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ වාර්තා පිළිගැන්වීම:** "අන්තර්ජාතික ථේරවාද ධර්මායතනය (සංස්ථාගත කිරීමේ)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 52(6) යටතේ බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයාගේ වාර්තාව නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරන ලදී.

පනත් කෙටුම්පත 2024 අප්‍රේල් 01 සඳුදා දෙවැනිවර කියවිය යුතු යැයි නියෝග කරන ලදී.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) සෞඛ්‍ය කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු සිසිර ජයකොඩි මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 7 (උ), 10 සහ 77 වගන්ති සහ VI කොටස සමඟ කියවිය යුතු 82 වගන්තිය යටතේ ආයුර්වේද සංග්‍රහය සම්බන්ධයෙන් සෞඛ්‍ය

අමාත්‍යවරයා විසින් 2024 ජනවාරි 24 දින සාදන ලද නියෝග සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී - පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු නීතිඥ තලතා අතුකෝරල මහත්මිය වෙනුවෙන් එම කාරක සභාවේ සාමාජික මන්ත්‍රී ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය විසින් කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව - 2022; සහ

(ii) පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව -2022

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) (i) සියඹලාපේ දකුණ, ගලහිටියාව පාර, අංක 84/14 දරන ස්ථානයෙහි පදිංචි ඩී.වී. මුණසිංහ මහත්මියගෙන් ලැබුණු 2023.12.14 දිනැති පෙත්සම;

(ii) රාගම, තුඩුවේගෙදර, තල්ගස්වල පාර, අංක 600/3 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්. හෙට්ටිආරච්චි මහත්මියගෙන් ලැබුණු 2023.12.01 දිනැති පෙත්සම;

(iii) මහනුවර, ලේවැල්ල පාර, අංක 58/5 බී දරන ස්ථානයෙහි පදිංචි පී. ඩී. ඒ. මුණසිංහ මහත්මියගෙන් ලැබුණු 2023.12.18 දිනැති පෙත්සම;

(iv) බත්තරමුල්ල, කොස්වත්ත, එකමුතු මාවත, අංක 325/ජී දරන ස්ථානයෙහි පදිංචි එස්.පී. වික්‍රමතුංග මහතාගෙන් ලැබුණු 2023.12.14 දිනැති පෙත්සම; සහ

(v) බණ්ඩාරවෙල, හීල් ඔය, මැදපේරුව, 'නතාෂා' යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.එච්. මල්ලිකා කාන්ති මහත්මියගෙන් ලැබුණු 2023.10.27 දිනැති පෙත්සම

ගරු විජිත හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(2) මුල්ලේරියාව නව නගරය, මුල්ලේරියාව උතුර, සිරිනිවාස මාවත, අංක 236/6 දරන ස්ථානයෙහි පදිංචි කේ.එම්.කේ.ජී.එස්. කැටිමින්ගම මහත්මියගෙන් ලැබුණු 2024.02.01 දිනැති පෙත්සම ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරනු ලැබේ.

**6. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 6.00 දක්වා විය යුතු ය. අ.භා. 12.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 6.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. යෝජිත 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීමේ දී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— යෝජිත 'ව්‍යාපාර සූදානම් (B-READY) දර්ශකය' සඳහා සූදානම් වීමේ දී මතු වන ප්‍රායෝගික ගැටලු හා දුෂ්කරතා අධ්‍යයනය කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2024 ජනවාරි 12 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2024 ජුනි 22 දින දක්වා දීර්ඝ කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,—රජය විසින් ප්‍රකාශයට පත් කළ මූල්‍ය බංකොලොත්භාවයට හේතු පරීක්ෂා කර පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමටත් වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබූ කරුණු, 2024 ජනවාරි 12 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව මඟින් නියම කර ඇති පරිදි පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට තවදුරටත් කාලය අවශ්‍ය වන බැවින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 102 ප්‍රකාරව එකී කාරක සභාවට ලබාදී ඇති කාලසීමාව, 2024 ජූලි 18 දින දක්වා දීර්ඝ කළ යුතුය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2):** පාර්ලිමේන්තුවේ සභානායකවරයා වෙනුවෙන් නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින විසිර යැමේදී මෙම පාර්ලිමේන්තුව 2024 අප්‍රේල් 01 සඳුදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. ශෝක ප්‍රකාශ යෝජනාව**: නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා විසින් අභාවප්‍රාප්ත ගරු ආර්. එම්. කරුණාරත්න මහතා, අභාවප්‍රාප්ත ගරු බන්දුල බස්නායක මහතා සහ අභාවප්‍රාප්ත ගරු (වෛද්‍ය) පී. එම්. බී. සිරිල් මහතා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කරන ලදී.

"ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 9.58 ට ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.)

"ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි මුදල් රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.09 ට ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.)

"ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු දිලිප් වෙදආරච්චි මහතා, ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(පූ.භා. 11.57 ට ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා මූලාසනාරූඪ විය.)

අභාවප්‍රාප්ත ගරු ආර්. එම්. කරුණාරත්න මහතා, අභාවප්‍රාප්ත ගරු බන්දුල බස්නායක මහතා සහ අභාවප්‍රාප්ත ගරු (වෛද්‍ය) පී. එම්. බී. සිරිල් මහතා යන හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා අනුමත කරමින් කථානායකවරයා සමඟ ඊට එකතු වූ මූලාසනාරූඪ මන්ත්‍රීවරයා මෙම යෝජනා සම්බන්ධ දිනට නියමිත පාර්ලිමේන්තු විවාද නිල වාර්තාවේ (හැන්සාඩ්) පිටපත් ශෝකයට පත් පවුල්වල අය වෙත යවන ලෙස පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරියට නියෝග කරන ලදී.

**11. කල් තැබීම (ගොවීන් මුහුණදෙන පොදු ගැටලු සඳහා සහන):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.30 ට ගරු ජගත් සමරවික්‍රම මහතා මූලාසනාරූඪ විය.)

"ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.25 ට ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.)

"ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි පශු සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 4.56 ට ගරු කිංස් නෙල්සන් මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ.භා. 5.52 ට මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින් 2024 මාර්තු 21 සභා සම්මතිය අනුව 2024 අප්‍රේල් 01 සඳුදා පූ.භා. 9.30 වනතෙක් පාර්ලිමේන්තුව කල් තබන ලදී.